මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය 2019

Primary Piriven First Term Test 2019

4 වසර - Grade 4

**සිංහල**

**Sinhala**

*කාලය පැය 03 යි*

*Time - Three Hours*

- *I* සහ*II* කොටසේ සියලු ප්‍රශ්නවලටත් *III*කොටසේ 4, 5 ඇතුළු තවත් එක් ප්‍රශ්නයකටත් පිළිතුරු සපයන්න.
- *I* කොටසේ අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා ප්‍රශ්න අංකය සමග ඔබගේ පිළිතුරු පත්‍රයේ ම සඳහන් කරන්න.

### *I*කොටස

1. සිදත් සඟරා හෝඩියේ ස්වර, ව්‍යංජන හා මුළු අකුරු ගණන පිළිවෙළින් නිවැරදි ව දැක්වෙන පිළිතුර තොරන්න.

   i. 12, 18, 20    iii. 10, 20, 30

   ii. 12, 20, 32    iv. 10, 30, 20

2. මිශ්‍ර සිංහල හෝඩියේ ස්වර, ව්‍යංජන හා මුළු අකුරු ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

   i. 18, 36, 54    iii. 18, 20, 38

   ii. 18, 42, 60    iv. 10, 20, 30

3. මිශ්‍ර සිංහල හෝඩියේ නැති නූතන සිංහල හෝඩියේ ඇති අකුරක් වන්නේ,

   i. ඥ    ii. ඤ    iii. ෆ    iv. ළ

4. පහත සඳහන් පිළිතුරු අතරින් සිදත් සඟරා හෝඩියේ අන්තර්ගත නොවන ස්වරයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

   i. අ, ඉ, උ, එ, ඔ    iii. අ, උ, ඊ, ඌ , ඕ

   ii. අ, ඇ, ඒ, උ, ඔ    iv. ආ, ඒ, ඕ, ඊ, ඉ

5. අනුස්වාරය, විසර්ගය, යංශය, රේඵය, රකාරාංශය යන සංකේත පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තොරන්න.

   i. සත්‍ය, අංශය, නූමය, වගීය, අන්තඃපුරය

   ii. අංකය, ප්‍රදර්ශනය, සාධ්‍ය, ධමී, තුඃ

   iii. නංගී, අන්තඃකණ්ඩය, සාහිත්‍ය, කමී, ප්‍රදර්ශන

   iv. බැංකු, දුඃඛ, අසත්‍ය, ද්‍රව්‍ය, පූණී

6. සාවද්‍ය වියරණ නීතියක් වන්නේ,

   i. තාලුජ අක්ෂරයක් සමඟ සංයුක්ත වන්නේ ''ශ'' කාරය යි.

   ii. මූර්ධජාක්ෂරයකට ප්‍රථමයෙන් ''ෂ'' නොයෙදේ.

   iii. ''ර'' අක්ෂරයට පසුව ''ෂ'' යෙදීම සම්මතය යි.

   iv. කණ්ඨජාක්ෂරයකට පූර්වයෙන් බොහෝවිට ''ශ'' කාරය යෙදේ.

7. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

i. නිශ්ශබ්ද, දුශ්චරිත, විකාෂණය
ii. විමර්ශනය, සංඛ්‍යය, ඖචිත්‍යය
iii. නමස්කාරය, කෘෂ්ණ, පුස්තකාලය
iv. ඓතිහාසික, මර්ධනය, අපරාධ

8. 'සන්ධි' පිළිබඳ සිදත් සඟරා කතුවරයාගේ අර්ථ දැක්වීම වන්නේ,

i. ''පෙරපර වණින් නිසිවිදිනි ගළපනු සඳ නම්''
ii. ''හව් කිරිය අරුත් කිරිය වී කිරිය පද දෙවැදෑරුම්''
iii. ''අදෙස් අගම් විදි පියවි සබඳ හ කරන්''
iv. ''පියවි නිසා හොත නොපියා හොත කෙළේ නිපා නම්''

9. ''ආගම'' සන්ධි කාර්ය සඳහා සුදුසු හැඳීන්වීම වන්නේ,

i. ව්‍යංජනයක් හෝ ස්වරයක් ද්විත්ව වීම යි.
ii. සන්ධි වන පද දෙකෙහි ඇති අකුරක් ලොප්කොට වෙනත් අකුරක් පැමිණවීම යි.
iii. සන්ධි වන පද දෙක අතරට අමුතුවෙන් අකුරක් පැමිණීම යි.
iv. ව්‍යංජන ශබ්දයක් ස්වර ශබ්දයක් බවට පත්වීම යි.

10. ස්වර සන්ධිය සඳහා සුදුසු නිර්වචනයක් වන්නේ,

i. ස්වර දෙකක් වෙනුවට වෙනත් ස්වරයක් ආදේශ කිරීමෙන් ගළපන සන්ධිය යි.
ii. සන්ධි වන පද දෙකෙන් මුල් පදයෙ අග හල් අකුර පසු පදයේ මුල ඇති ස්වරය හා සම්බන්ධ කොට ගළපන සන්ධිය යි.
iii. ස්වරයක් වෙනුවට වෙනත් ව්‍යංජනයක් ආදේශ කිරීමෙන් සිදුවන සන්ධිය යි.
iv. සන්ධි වන පද දෙකෙන් පසු පදයේ මුලකුර ලොප් කොට ගළපන සන්ධිය යි.

11. පූර්ව ස්වර ලෝප සන්ධිය සඳහා උදාහරණයක් නොවන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. මැදැගිල්ල, දිනිසුරු, විදුරවියේ, කනීල්
ii. දිගා, කනීල්, ගිරග, රියැදුරු
iii. ගුණැති, වඩුරා, වැටුපිසපත, අරුණලු
iv. දකුණත, කෙක්කෙන්, දිනිඳු, රුවැති

12. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය සඳහා උදාහරණයක් නොවන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ගම්පළ, මිහින්තලය, ළිංපඩිය, ළිංවතුර
ii. ගංවතුර, ගංදිය, නෙළුම්මල්, මුංබියලි
iii. සංමිත්, කොළොම්තොට, බුත්සරණ, ගංරන්
iv. මංමුළා, මුංබියලි, ළිංගැට්ට, මිහින්තලාව

13. 'සමාස' පිළිබඳ සිදත් සඟරා කතුවරයාගේ අර්ථ දැක්වීම වන්නේ,

i. ''සමාසො පද සංඛෙපො''
ii. ''නේ සඳන් සියොවැ එක සඳ අයුරක් වන සේ ගළපනු සමස් නම්''
iii. ''පද යොන් දා පියවි නම්''
iv. ''පෙරපර වණින් නිසිවිදිනි ගළපනු සමස් නම්''

14. අව්‍ය සමාසයෙහි ප්‍රභේදයක් ලෙස සිදත් සඟරා කතුවරයා නො දක්වන්නේ,

i. ''ප'' ආදි ගණය
ii. ''කු'' ආදි ගණය
iii. ''න'' ආදි ගණය
iv. ''ද'' ආදි ගණය

15. ''න'' වර්ගයේ අව්‍ය සමාස සඳහා උදාහරණ වන පද පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

i. අශිෂ්ට, අපමණ, කුපුරිස්, කුකවි, යතලබ

ii. අනුගමනය, අශෝක, අදිසි, අනිටු, අමාරු

iii. දුලද, දුබල, දුලබ, අනුබල, උපවන

iv. අකුසල්, අනවශ්‍ය, අනදර, අනිටු, අනූන

16. අන්‍යාර්ථ සමාසයට අයත් පද පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

i. තිනෙත්, දුන්වත්, මහඔසුපඬි, දසබල, කහකුරුල්ලා

ii. සිංහලේ, මහෞෂධ, ලියකොමළ, මහලුමඩම, ගොපල්ලා

iii. සුන්බත්, සුන්තුරු, සහසැස්, තිනෙත්, මත්තේගජන්

iv. එළුමස්, හරක්මස්, අනංග, ගල්හිත, ගුළුගොනගුල්

17. දකාරාර්ථ සමාස පද පමණක් යෙදුණු පිළිතුර වන්නේ,

i. ඇත්අස්රියපාබල, ගස්වැල්, ගඟේවැලි, කළුසුද්දා, නරසීහ

ii. ඇස්කන්, දරුමුණුබුරු, ගැහැනුපිරිමි, අලිඇතුන්, මල්පහන්

iii. ලඹසවන්, දුසිල්, දුබල, අතිවිශේෂ, අනරුත්

iv. සඳහිරුතරු, අලබතලමඤ්ඤොක්කා, මව්පිය, ගස්වැල්, අලිඇතුන්

18. ප්‍රත්‍යාර්ථ නාම වශයෙන් සැළකෙන්නේ,

i. උපසර්ග හා නිපාත

ii. තද්ධිත හා කෘදන්ත

iii. සමාස හා ප්‍රකෘති

iv. නාමපද හා ක්‍රියාපද

19. තද්ධිත ප්‍රත්‍ය යෙදීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. නාම ප්‍රකෘතියකට පසුව විභක්ති ප්‍රත්‍ය යෙදීමෙන් පසු තද්ධිත ප්‍රත්‍යය යොදනු ලැබේ.

ii. ධාතු ප්‍රකෘතියකට පසුව විභක්ති ප්‍රත්‍ය යෙදීමෙන් පසු තද්ධිත ප්‍රත්‍යය යොදනු ලැබේ.

iii. නාම ප්‍රකෘතියකට පසුව විභක්ති ප්‍රත්‍ය යෙදීමට පෙර තද්ධිත ප්‍රත්‍යය යොදනු ලැබේ.

iv. ධාතු ප්‍රකෘතියකට පසුව විභක්ති ප්‍රත්‍ය යෙදීමට පෙර තද්ධිත ප්‍රත්‍යය යොදනු ලැබේ.

20. වර්තමාන කාල කර්තෘකාරක කෘදන්ත පද පමණක් යෙදුණු පිළිතුර වන්නේ,

i. පිහිටි, බැලෙන, කරන

ii. ගතු, ලියූ, කියනා

iii. කරනු, කියනා, සිතන

iv. බැලීම්, කියමන්, නටනු

## *II* කොටස

2. පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

i. පිරුණු කළේ දිය නොසැලේ.

ii. මම වනයෙහි අතරමං වීමි.

iii. කසළවලින් තොර හෙටක්

iv. මත් රකුසාගෙන් තරුණ පරපුර බේරාගනිමු.

v. අරි අටඟි මගින් දැහැමි සමාජයක් කරා

3. (අ)අකාරාන්ත "ශිෂ්‍ය" ශබ්දය සියලු විභක්තීන්හි වරනගන්න.

(ආ)පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| යටැසින් දෙන බැල්මෙන් සුර | විලසී |
| වෙසෙසින් දන මන මත් කර | එකසී |
| අහසින් රඟ බැස ගත් රඟ | කෙලෙසී |
| දිසිමෙන් විය විදුලිය සිය | දහසී |

i. මෙම කවිය ඇතුළත් වන කෘතිය, එය රචිත යුගය හා කතුවරයා නම් කරන්න.
ii. මෙහි යටැසින් බැලුම් හෙළන්නේ කවුරුන් ද?
iii. මෙහි සඳහන් එක් උපමාවක් දක්වන්න.
iv. ''දන මන මත් කර එකසී'' යන්නෙහි අර්ථ දක්වන්න.
v. මෙහි ජනයාගේ සිත් මත් භාවයට පත්වන්නේ කුමකින් ද?

### *III* කොටස

4. i. සංඝරාජ සාධු චරියාවේ කර්තෘ හා එය රචනය වූ කාලය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.(ලකුණු 05)
   ii. වැලිවිට සරණංකර හිමියන්ගේ ජීවන තොරතුරු සැකෙවින් දක්වන්න. (ලකුණු 05)
   iii. පිරිහී ගිය ශාසනික වත්පිළිවෙත් නැවත නගා සිටුවීමෙහිලා සරණංකර නාහිමියන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.(ලකුණු 05)

5. i. ගුත්තිල කාව්‍යයේ තේමාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.(ලකුණු 05)
   ii. ගුත්තිල කාව්‍ය රචකයාගේ උපමාලංකාර යෙදීමේ චතුරතාව නිදසුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)
   iii. ගුත්තිල කාව්‍ය රචකයා ශබ්ද හා අර්ථ රසය මැවෙන සේ සුරඟන නර්තනය මැනවින් වර්ණනා කර ඇත. එක් කවියක් උදාහරණයට ගෙන මෙම කියමන විස්තර කරන්න. (ලකුණු 05)

6. ගොවිජන ජීවිතය දුක, කඳුල, උත්සාහය, කැපවීම යන නොයෙක් කරුණු අනුව ගතවෙන්නකි. මෙම කියමන චරිත තුනක් නවකථාවේ මුල් පරිච්ඡේදය ඇසුරින් විස්තර කරන්න.(ලකුණු 10)

7. චරිත තුනක් නවකථාවේ ඉසාගේ චරිතය පිළිබඳ ඔබ උගත් පරිච්ඡේදය ඇසුරින් විස්තරයක් කරන්න. (ලකුණු 10)